මුද්‍රණ ක්‍රියාවලිය පූර්ණ සෞඛ්‍යාරක්ෂිතයි. බෙදාහැරීමේ ක්‍රියාවලිය පූර්ණ සෞඛ්‍යාරක්ෂිතයි. අරුණ පුවත්පත ඔබගේ සෞඛ්‍යාරක්ෂාව තහවුරු කරමින් සැමද ඔබ අතට පත් කෙරේ.

වසර 15ක අපේ උත්සහයේ ජයග්‍රහණය

බයෝෆිල්ම් ජෛව පොහොර

අම්පාර උහන ප්‍රදේශයේ ව්‍යාපෘතියට දායකවූ ගොවියෙක්

■ ගැමුණු ධර්ම ශ්‍රී හේරත් - මාතලේ

රසායනික පොහොර ආනයනය සඳහා වසරකට රුපියල් බිලියන 50ක් පමණ ශ්‍රී ලංකාව වැය කරන අතර ඉන් රුපියල් බිලියන 40 ක් පොහොර සහනාධාර වශයෙන් රජය වැය කරන බව අනාවරණය වේ. එසේම රසායනික පොහොර නිසා අපේ රටේ සරු බිම ආසාදනයවී විවිධ රෝගාබාධ රැසකට මේ වනවිට රට මුහුණපා ඇත. මේ කරුණ වටහාගත් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ජෛව විද්‍යාත්මක ක්‍රමයක් ලෙස බයෝෆිල්ම් ජෛව පෙහොර භාවිතයෙන් ශ්‍රී ලාංකීය ගොවි ජනතාව වෙත මේ දිනවල සහනාධාර ක්‍රියාවලියක් ලෙස ක්‍රියාවට නංවා තිබෙන බව ජාතික මූලික අධ්‍යයන ආයතනයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ මහාචාර්ය ගාමිණී සෙනවිරත්න කියයි. සශ්‍රීක වූ සාරවත් බවභෝග සඳහා අතීතයේ කීර්තියට පත් රටක් වූ ශ්‍රී ලංකාව පසුගිය වසර 60 ක කාලය පුරා රසායනික පොහොර අධික වශයෙන් භාවිත කිරීම නිසා පස දූෂණය වී, වගාවන්ට සහ ජන ජීවිතයට අභියෝගාත්මක තත්ත්වයක් උදවී ඇති බව පර්යේෂණ වලින් අනාවරණයවී ඇති බවත් ජාතික මූලික අධ්‍යාපන ආයතනයේ කරන ලද නිරීක්ෂණ මතින් හඳුනාගෙන ඇති බව දන්වා සිටී.

වර්තමානයේ මෙම තත්ත්වය උග්‍රවී ඇත්තේ තව තවත් අධික ලෙස රසායනික පොහොර, වගාවන් සඳහා භාවිත කිරීම සහ විවිධ වසංගත රෝගවලින් වගාවන් බේරා ගැනීම සඳහා වැඩි වශයෙන් පළිබෝධනාශක භාවිත කිරීම නිසා කෘෂි රසායනික භාවිත උගුලක ශ්‍රී ලංකාව හසුවී තිබීම හේතුවෙනි.

මෙම තත්ත්වය හමුවේ නැවුම් බලාපොරොත්තු දල්වමින් උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශයට අනුයුක්ත ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පරේයේෂණ ආයතනයක් වන “ජාතික මූලික අධ්‍යාපන ආයතනයේ” (National Institute of Fundamental Studies - NIFS) විද්‍යාඥයන් කණ්ඩායමක් මීට වසර 15කට අධික කාලයක් පුරා සිදු කළ පරේයේෂණයක ප්‍රතිඵලයක් ලෙස පරිසර හිතකාමී ජෛව පොහොර නිෂ්පාදන තාක්ෂණය සොයා ගෙන ඇත. ලොව ප්‍රථම වරට ශ්‍රී ලංකාවේදී නිෂ්පාදනය කළ මෙම පොහොර මගින් රසායනික පොහොර භාවිතය 50%ක් දක්වා අඩු කළ හැකි අතර ප්‍රධාන වාණිජ වගාවන්ගේ පලදාව 10%-30% ත් අතර ප්‍රමාණයකින් වැඩි කිරීමටද හේතු වන බව හඳුනාගෙන ඇත. ජාතික වැදගත්කමක් දක්වන මෙවැනි පර්යේෂණ සඳහා මූල්‍ය දයකත්වය ලබාදෙන උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය මෙම පරිසර හිතකාමී නිෂ්පාදනය ශ්‍රී ලාංකීය ගොවි ජනතාව වෙත හඳුන්වා දීමෙන් දිවයිනේ විවිධ ප්‍රදේශවල සහනාධාර ක්‍රමවේදයක් මත ගොවීන් වෙත ලබාදීම සිදුකෙරේ.

ශ්‍රී ලංකාවෙන් පමණක් ලබා ගන්නා අමුද්‍රව්‍ය වලින් නිෂ්පාදනය කරන (Biofilm) නම් මෙම ජෛව පොහොර පරිසර හිතකාමී, 100% ස්වභාවික සහ රසායනික ද්‍රව්‍ය වලින් තොර කාබනික නිෂ්පාදනයක් වේ. (Biofilm) හි බැර ලෝහ වන කැඩ්මියම් (Cadmium - Cd) ආසනික් (Arsenic -), ලෙඩ් (Lead - Pb) සහ මර්කරි (Mercury - Hg) වැනි බැර ලෝහ අඩංගු නොවන අතර සිරුරට අහිතකර ක්ෂුද්‍ර ජීවීන් කිසිවක් මෙම නිෂ්පාදනයේ අඩංගු නොවන බව දන්වා සිටී.

ජාතික මූලික අධ්‍යයන ආයතනයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ මහාචාර්ය ගාමිණී සෙනවිරත්න මහතා

වසර ගණනාවක් පුරා “Biofilm” ජෛව පොහොර කෘෂිකාර්මික වගා බිම්වලට සාර්ථකව අත්හද බැලීමෙන් අනතුරුව මේ වන විට වී වගාව සඳහා හඳුන්වා දී තිබේ.

උක්ත පසුබිම යටතේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ සංකල්පයක් මත දැයේ ජනතාවට වස විසෙන් තොර ආහාර වේලක් ලබාදීමේ උදර සංකල්පයක් මත නිරෝගී සහ පලදායී පුරවැසියෙක් බිහිකිරීම යන තේමාව යටතේ ගොවි ජනතාව ක්‍රමානුකූලව පූර්ණ වශයෙන් කාබනික පොහොර භාවිත කර වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය සඳහා දිරි ගැන්වීමට කාබනික පොහොර නොමිලේ ලබා දීමට වැඩපිළිවෙළක් 2020 යල කන්නයේ සිට ක්‍රියාත්මක වේ. “Biofilm” ජෛව පොහොර නිෂ්පාදනයද මෙම “පරිසර හිතකාමී පොහොර නියමු ව්‍යාපෘතිය” සඳහා තෝරාගෙන ඇති අතර යල කන්නය තුළදී කුරුණෑගල හා අම්පාර දිස්ත්‍රික්කවල අක්කර 15,000 ක පමණ රසායනික පොහොර භාවිතය 25% ක් අඩු කර ” “Biofilm” ජෛව පොහොර භාවිතයෙන් වී වගාව කෙරෙනු ඇත. මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයේ ජාතික පොහොර ලේකම් කාර්යාලය මගින් මෙම පරිසර හිතකාමී පොහොර ව්‍යාපෘතිය මෙහෙයවනු ලබන අතර ඒ සඳහා ”ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS)” සිය සහයෝගීත්වය සපයයි.

“Biofilm” ජෛව පොහොර වලින් ඇතිවන වාසි ලෙස රසායනික පොහොර භාවිතය අඩු කර වැඩි පලදාවක් ලබා ගත හැකි වීමත්, 10-30% ප්‍රමාණයකින් පලදාව වැඩි කර ගැනීමත්, පසේ පාරිසරික සාධක වැඩි කර ශක්තිමත් මුල් පද්ධතියක් ඇති කර ගැනීම හා පසෙහි නයිට්‍රජන් ප්‍රතිශතය වැඩි කර නියඟයන්ට ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කර ගැනීම හා පසේ වගාවට හිතකර ක්ෂුද්‍ර ජීවීන්ගේ ගහනය වැඩි කර රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව වැඩි කර ගැනීම මෙම ව්‍යාපෘතියේ මූලික පරමාර්ථවේ.

100% ක් ස්වභාවික සහ කාබනික “Biofilm” ජෛව පොහොර භාවිතය මගින් මෙරට වගා බිම් යළි සාරවත් කර ගත හැකි අතර ජනතාවගේ සෞඛ්‍ය රැක ගැනීම පමණක් නොව රසායනික පොහොර ආනයනයට වැය කරන අති විශාල ධනස්කන්ධය රටේම ඉතිරි කර ගැනීමට“Biofilm” ජෛව පොහොර මගින් හැකියාව ලැබෙන බව මහාචාර්ය ගාමිණී සෙනවිරත්න දන්වා සිටී.